ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: PS/SD/GS/PME/10/2018(6)
තිරසර සංවර්ධන අංශය,
ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය,
ජනාධිපති කාර්යාලය.

2018.11.05

දිස්ත්‍රික් ලේකම්තුමා / දිසාපතිතුමා
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
.......................................

හිතවත් දිස්ත්‍රික් ලේකම්තුමනි / දිසාපතිතුමනි.

**<u>ග්‍රාමශක්ති ප්‍රජා පාලිත ගම්මාන හා නිෂ්පාදන හා සේවා අභිමුඛ ගම්මාන තෝරා ගැනීම ( දෙවන අදියර සඳහා )</u>**

අතිගරු ජනාධිපතිතුමාගේ තිරසර සංවර්ධන දැක්ම යටතේ දිළිඳුකම පිටුදැකීමේ අරමුණින් ක්‍රියාත්මක වන ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය යටතේ 2017 වර්ෂය සඳහා තෝරාගත්, 2018 වර්ෂය තුළ ග්‍රාමශක්ති ජනතා සමිති ලෙස ලියාපදිංචි කරන ලද, සෑම ග්‍රාම නිලධාරි වසමකටම රුපියල් මිලියනය බැගින් වූ මූලික ප්‍රතිපාදනයක් මේ වනවිටත් ලබා දී ඇත.

02. එම ප්‍රතිපාදන ග්‍රාමශක්ති සමිති ගිණුම්වලට ලබාදීමේ කටයුතු මේ වන විටද අවසන් කර, එම සමිති ක්‍රියාකාරි තත්ත්වයට පත් කර ඇතැයි සිතමි. එබැවින් එම ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රජා පාලිත හා නිෂ්පාදන හා සේවා අභිමුඛ ගම්මාන තුළ ග්‍රාම සංවර්ධන සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘතියක් 2018 දෙසැම්බර් 15 වන දිනට පෙර ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ දෙවන අදියර සඳහා ප්‍රජා පාලිත ගම්මාන සහ නිෂ්පාදන හා සේවා අභිමුඛ ගම්මාන තෝරා ගැනීමේ කටයුතු ද කඩිනමින් සිදුකළ යුතුව ඇත.

03. 2019 ජනවාරි මාසයේ සිට 2018/2019 දෙවන අදියරේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බැවින්, පහත නිර්ණායක පදනම් කර ගනිමින් ප්‍රජා පාලිත හා නිෂ්පාදන හා සේවා අභිමුඛ ගම්මාන තෝරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන මෙන් ඉල්ලමි. එසේම නිෂ්පාදන හා සේවා අභිමුඛ ගම්මාන ලෙස තෝරාගත් ගම්වල යෝජිත ව්‍යවසායට අදාළ ව්‍යාපාර සංවර්ධන සැලැස්ම සැකසීම ද මේ සමඟ ආරම්භ කළ යුතු වේ.

**ප්‍රජා පාලිත ගම්මාන තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු ප්‍රධාන නිර්ණායක,**

01. i. ග්‍රාම නිලධාරි වසම තුළ බීමට පිරිසිදු ජලය නොමැති පවුල් සංඛ්‍යාව
ii. එම සංඛ්‍යාව මුළු පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

02. i. ග්‍රාම නිලධාරි වසම තුළ සනීපාරක්ෂක වැසිකිලි නොමැති පවුල් සංඛ්‍යාව
ii. එම සංඛ්‍යාව මුළු පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

03. i. ග්‍රාම නිලධාරි වසම තුළ ස්ථිර නිවසක් නොමැති පවුල් සංඛ්‍යාව
ii. එම සංඛ්‍යාව මුළු පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

04. i. ග්‍රාම නිලධාරි වසම තුළ සමෘද්ධි දීමනා ලබන පවුල් සංඛ්‍යාව
ii. එම සංඛ්‍යාව මුළු පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: 011 2354354, 011 4354354
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2340340
ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail: ps@presidentsoffice.lk

05.i. ග්‍රාම නිලධාරි වසම තුළ කාන්තා මූලික පවුල් සංඛ්‍යාව
ii. එම සංඛ්‍යාව මුළු පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

06.i. ග්‍රාම නිලධාරි වසම තුළ සමස්ත ශ්‍රම බලකාය
(වැඩකළ හැකි අවුරුදු 18 - 65 අතර ගැහැණු පිරිමි)
ii. ශ්‍රම බලකායේ රැකියා / අර්ධ රැකියා කරන ප්‍රමාණය
iii. එම සංඛ්‍යාව මුළු පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

07.i. විදේශගත වී ඇති කාන්තාවන්ගේ සංඛ්‍යාව
ii එම පවුලේ වයස අවුරුදු 20 ට අඩු දරුවන් සංඛ්‍යාව.

04. රජයේ හෝ රාජ්‍ය නොවන ආයතනයක් මගින් දැනටමත් දුප්පත්කම අවම කිරීම මූලික කර ගනිමින් ප්‍රධාන වැඩසටහන් ක්‍රියාත්මක කරන ග්‍රාම නිලධාරි වසම් ප්‍රජා පාලිත ගම්මාන වැඩසටහන් සඳහා තෝරා නොගන්නේ නම් එමගින් වෙනත් සුදුසු ගම්මානයකට එම අවස්ථාව හිමිවනු ඇත.

05. තවද , මෙම ගම්මාන තෝරා ගැනීමේදී නිරතුරුව ස්වභාවික විපත්වලට මුහුණපාන ගම්මාන පිළිබඳව ද , බීමට ජලය සොයා කිලෝමීටර් භාගයක් දුර ගෙවා යන ප්‍රමාණයන් පිළිබඳව ද , කිසිදු වැසිකිලි පහසුකමක් නොමැති පවුල් පිළිබඳව හා ප්‍රාථමික අධ්‍යාපනයෙන් පසු පාසල් හැර යන දරුවන් පිළිබඳව ද , මව්වරුන් විදේශගතවීම හේතුවෙන් පීඩාවට පත්වූ දරුවන් පිළිබඳව හා ත්‍රස්තවාදී ගැටුම්වලට මැදිහත්වී පීඩාවට පත්වූ පවුල් පිළිබඳව ද විශේෂ අවධානය යොමු කරන්නේ නම් මැනවි.

**නිෂ්පාදන හා සේවා අභිමුඛ ගම්මාන තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු ප්‍රධාන නිර්නායක.**

i. එකම වර්ගයක නිෂ්පාදන හෝ සේවාවන් සපයන ව්‍යවසායකයින් වැඩිපිරිසක් සිටීම.
ii. එකම වර්ගයක නිෂ්පාදන හෝ සේවා සැපයීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය බහුලව පැවතීම.
iii. නිෂ්පාදන හෝ සේවාවන් ප්‍රවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි පැවතීම.
iv. දැනටමත් එකම වර්ගයක නිෂ්පාදන හෝ සේවාවන් සපයන සැලකිය යුතු නිෂ්පාදකයින් හෝ සේවා සපයන්නන් ඒකරාශී වී සිටීම.
නිෂ්පාදන හා සේවා සඳහා අඛණ්ඩ අලෙවි කරන පහසුකම් නොමැතිවීම
vi. නිෂ්පාදන හා සේවා සැපයීමට අදාළ නිශ්චිත වෙළෙඳපොලක් පැවතීම.
vii. සිදුකරනු ලබන නිෂ්පාදන හා සේවාවන් සඳහා ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින ඉල්ලුමක් පැවතීම.
viii. නිෂ්පාදන හා සේවාවන් ප්‍රවර්ධනය සඳහා දැනටමත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දායකත්වය සැලකිය යුතු මට්ටමකින් ලබාගෙන තිබීම.
ix. නිෂ්පාදන හා සේවා ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඉහළ දායකත්වයක් ලබාගැනීමට අවශ්‍ය පහසුකම් පැවතීම.

06. මීට අමතරව කිසියම් ග්‍රාම නිලධාරි වසමක හෝ වසම් කීපයක් තුළ නිෂ්පාදන හා සේවා අභිමුඛ ගම්මානයක් සැකසීමට අවශ්‍ය පහසුකම් පවතින්නේ නම්, එම ගම්මාන තෝරා ගැනීමට ඔබගේ සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අභිමතය පරිදි සිදුකළ හැකි වේ.

07. එසේම නිෂ්පාදන හා සේවා අභිමුඛ ගම්මාන තෝරා ගැනීමේදී ග්‍රාම නිලධාරී වසම තුළට සීමාවීම අවශ්‍ය නොවන අතර, එක් ප්‍රධාන නිෂ්පාදනයක් හෝ සේවාවක් සළකා බැලීම වැදගත් වේ. එසේම නිෂ්පාදන හා සේවා පිළිබඳ විභවතාවයන් අධ්‍යයනය කොට මූලික විශ්ලේෂණයක් සිදු කිරීමෙන් අනතුරුව පමණක් මෙම ගම්මාන තෝරා ගැනීම වඩාත් උචිත වනු ඇත.

08. ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉහත නිර්ණායක අනුව තෝරා ගන්නා ගම්මාන සම්බන්ධව ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී මහජන නියෝජිතයන් දැනුවත් කිරීම තුළින් මෙම වැඩපිළිවෙල පිළිබඳව ඔවුන් දැනුවත්භාවයක් ලබා ගනු ඇත.

09. ඉහත කරුණු පදනම් කර ගනිමින් ඔබ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම්වල තොරතුරු එක් රැස් කර , ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රමුඛතාගත කර , 2018 දෙසැම්බර් මස 15 දිනට පෙර මා වෙත එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

10. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගම්මාන තෝරා ගැනීමේදී ඉහත නිර්ණායකවලට අමතරව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති දුප්පත්කම පිළිබඳ දර්ශකය ද පදනම් කර ගැනීම වඩාත් සුදුසු බව යෝජනා කරමි. ඉහත නිර්ණායකයන් පදනම් කර ගනිමින් ප්‍රාදේශීය ලේකම් විසින් තෝරා ගන්නා ලද , ඔබගේ නිර්දේශය මත එවනු ලබන ග්‍රාම නිලධාරී වසම්වල තොරතුරු මත ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඉහත දර්ශකය පාදක කර ගනිමින් ඔබ දිස්ත්‍රික්කයට හිමි ග්‍රාමශක්ති වසම් සංඛ්‍යාව ඇතුළත් නාමලේඛනය ග්‍රාමශක්ති කාර්යාලය විසින් හැකි ඉක්මණින් ඔබ වෙත ලබා දෙනු ඇත.

11. ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමා / ඔබතුමිය/ප්‍රාදේශීය ලේකම්වරු ලබාදෙන සුවිශේෂී දායකත්වය ඉතා අගය කොට සලකන අතර, තවදුරටත් මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබතුමාගෙන් / ඔබතුමියගෙන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් මහඟු සහයක් අපේක්ෂා කරමි.

මෙයට,
සේවා ලැදි,

උදය ආර්. සෙනෙවිරත්න
ජනාධිපති ලේකම්.

අ/කළේ: චන්ද්‍රරත්න පල්ලේගම
ජනාධිපති අතිරේක ලේකම්
තිරසර සංවර්ධන අංශය

පිටපත
1. ගරු, ජනාධිපතිතුමාගේ පෞද්ගලික ලේකම් - කා.දැ.ගැ.හා ජනාධිපති දිස්ත්‍රික් සම්බන්ධීකරණ ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා
2. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ගැ.හා හා අවශ්‍ය කටයුතු සඳහා
3. පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කා.දැන ගැනිම සඳහා